13

# කොහොඹායක් කංකාරියෙහි භාවිත හත්පදය

*ජී. එම්. එස්. එස්. විජේවර්ධන* [1]
HS/2014/1257

කොහොඹායක් කංකාරියට අයත් පුද-පූජා රටාවෙහි භාවිත වැදි යකුම් නැටීමේ චාරිත්‍රයේදී යොදා ගන්නා හත්පදය නම් නර්තනාංගය භාවිත වන ආකාරය පිළිබඳ විග්‍රහ කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි මූලික අරමුණ වේ. කොහොඹායක් කංකාරිය උඩරට ප්‍රදේශයේ ප්‍රචලිත සශ්‍රීකත්වය හා රෝග නිවාරණය සඳහා යොදා ගන්නා යාතු කර්ම විශේෂයකි. එහිදී ඒකී යාතුකර්මයට අයත් පුද පූජා විධි අතර සවස් යාමයේ සිදුකරන චාරිත්‍රයක් වන හත්පදය සුවිශේෂීවූ නර්තනාංගයක් ලෙස හැඳින්විය හැකිය. මෙම අධ්‍යයනය සඳහා නියැදි ලෙස උපයෝගී කර ගනුයේ සත් කෝරළය, සතර කෝරළය, මහනුවර යන ශෛලීන්හි ඉහත සඳහන් කළ හත්පදය යොදා ගනු ලබන ආකාරය පිළිබඳව ය. දැනට ලියැවී ඇති මූලාශ්‍ර සාධක මෙන්ම ක්ෂේත්‍ර ගවේෂණය මගින් ලබා ගන්නා ලද දත්ත ඉහත අරමුණු විශ්ලේෂණය කිරීම සඳහා උපයෝගීකර ගැනීමට අපේක්ෂිතය. පර්යේෂණයේදී හඳුනා ගන්නා ලද සාධක සහ දත්ත විශ්ලේෂණය කිරීමේදී මහනුවර ශෛලියෙහිදී පද 06 ක් භාවිතා කරනු ලබන අතර සත්කෝරළයෙහි සහ සතර කෝරළයෙහි යන ශෛලියෙහිදී පද 07 බැගින් භාවිත කරනු ලබන බව දැක ගත හැකිය. එහිදී මහනුවර ශෛලියෙහිදී බුලත්, කොතල, සළු, දුම්මල, පොල්, වැදිපෙට්ටිය සහ කොරවැද්දන් යන පද 07 අයත් වන අතර නමුත් වර්තමානයේදී කොරවැද්දන් පදය නර්තනය කිරීමක් දැකගත නොහැකි ය. සත් කෝරළයෙහිදී සැවුල්, සළු, පොල්, බුලත්, කොතල, දුම්මල, යහන් මුට්ටි යන පද 07 ඉදිරිපත් කරනු ලබයි. සතර කෝරළයෙහිදී බුලත්, කොතල, සළු, දුම්මල, පොල්මල්, මොට්ටැප්පිලි යන පද 07 ඉදිරිපත් කරනු ලබයි. මෙහිදී කොහොඹායක් කංකාරියට අයත් පුද පූජා රටාවට අදාළ වන සුවිශේෂ වූ හත්පද නර්තනය විවිධ නර්තන පරම්පරාවල ඉදිරිපත් කරනු ලබන ආකාරය පිළිබඳ අවධානය යොමු කිරිමට අපේක්ෂිත ය.

ප්‍රමුඛ පදඃ කොහොඹායක් කංකාරිය, හත්පදය, යාතු කර්ම, නර්තනාංග

*1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) ප්‍රථම වසර*